# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/181/2023 (PSC)**

එන්.එම්.ඒ.අමරදේව
**අභියාචක**

**එදිරිව,**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.01.06**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක එම්.ඩී.සී.ඒ.පෙරේරා මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් එල්.එල්.ඩී.එස්.පෙරේරා මහත්මිය.

**-<u>නියෝගය</u>-**

**ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි.අධිකාරය**

අභියාචක එන්.එම්.ඒ.අමරදේව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ නිළධාරියෙකි. දැනට ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධාන මූල්‍ය නිළධාරී ලෙස සේවය කරයි. ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු 2015.01.01 දින සිට 2021.09.30 දින දක්වා දීර්ඝ කාලයක් තුළ අධිකරණ නඩු සහ වෘත්තීය සමිති ගැටලු නිසා පිරවීමට අපහසුවී තිබුණි. පසුව පැවති එකඟතා වලට අනුව පුරප්පාඩු 88 ක් පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබීය. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2022.07.07 දිනැති ලිපිය පරිදි 2021.09.30 දිනට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණි පත්වීම් ලබා දීම සිදු කර ඇත. මුල් අවස්ථාවේදී අභියාචක ඒ සඳහා තේරී පත්වී නැති අතර ඒ.ආර්.එම්.නිසාම් සහ එස්.එල්.ආදම්බාවා නැමැති නිළධාරීන් දෙදෙනා අදාළ සුදුසුකම් සපුරා නැති

බැවින් ඒ නිළධාරීන් දෙදෙනා වෙනුවට, එන්.එම්.ඒ.අමරදේව මහතා(අභියාචක), පී.එස්.එන් ප්‍රනාන්දු මහත්මිය යන අය අදාළ ලේඛනයේ ඊළඟ සුදුසුකම් සපුරා සිටි නිළධාරීන් දෙදෙනා 2021.09.30 දින සිට ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියට පත් කිරීමට 2022.10.06 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලිපිය මඟින් දන්වා ඇත. ඉන් පසුව අදාළ සියළු නිළධාරියාගේ පත්වීම් පුරප්පාඩු ඇති වූ දිනට පෙරදාතම් කිරීම යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2023.03.10 දින දරන ලිපිය මඟින් අභියාචක ඇතුළු විශාල පිරිසකගේ පත්වීම් පෙරදාතම් කර ඇත. ඒ අනුව අභියාචකගේ පත්වීමද 2021.06.18 දිනට පෙරදාතම් කර ඇත.

මෙම උසස් කිරීම අනුව අභියවක 2023.03.02 දින දරන රාජ්‍ය පරිපාලන ලේකම්ගේ ලිපිය අනුව වාරි මාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිළධාරී තනතුරට පත්කර ඇත. අදාළ ලිපියේ III ඡේදය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 1/2021 දරන චක්‍රලේඛය කෙරෙහිද අවධානය යොමු කරන බව වැඩි දුරටත් දන්වා ඇත. එසේ වුවත් අදාළ පත්වීම් ලිපිය අනුව අභියාචක තනතුර භාර ගෙන නොමැත. ඒ වෙනුවට පුද්ගලික දුෂ්කරතා හේතුවෙන් මෙම පත්වීම භාර ගැනීම අපහසු බව දන්වා දකුණු පළාත් සභාවේ තවදුටත් සේවය කිරීමට අවසර ඉල්ලා ඇත. 2023.04.03 දින ආණ්ඩුකාරතුමා ඒ සඳහා එකඟතාවය පළ කර ඇත.

ආණ්ඩුකාරතුමා එසේ එකඟ වුවද අදාළ පළාත් සභාවේ ඒ අවස්ථාව වන විට ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක පුරප්පාඩුවක් නැති බැවින් අභියාචකට සති 02 ක් තුළ ලබාදී ඇති අදාළ තනතුරේ රාජකාරී භාර ගන්නා ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇත.

ඉන්පසුව නැවත රාජ්‍ය පරිපාලන ලේකම් විසින් ඔහුගේ 2023.09.02 දිනැති ලිපිය මඟින් අභියාචක විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිළධාරි තනතුර සඳහා පත්කිරීම් කර දන්වා යවා ඇත. ඒ ලිපියට අනුවද අභියාචක තනතුර භාර ගෙන නොමැත.

මේ අවස්ථාවේදී, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2023.08.21 දින දරන තීරණයට එරෙහිව අභියාචක මෙම ආයතනයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. AAT/181/2023 දරන එම අභියාචනය 2023.09.23 දින මෙම අධිකාරයට ඉදිරිපත් කර ඇත.

ඒ අභියාචනය මගින් විවිධ අපහසුතා මෙන්ම පූර්ව සිද්ධීන් විස්තර කර ඇත. ඒ අනුව තව දුරටත් දකුණු පළාත් සභාව යටතේ සේවය කිරීමට අවස්ථාව ඉල්ලා සිටී. කෙසේ වුවත්, මෙසේ අවස්ථා දෙකකදී සිදු කරන ලද පත්වීම් භාර නොගැනීම මත 1/2021 චක්‍රලේඛනය පරිදි ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියට පත්වීම 2024.03.24 දින ලිපිය මගින් අවලංගු කර ඇත.

මේ අතරතුර දකුණු පළාත් සභාවේ ආණ්ඩුකාර විසින් 2024.01.30 දින දරන ලිපිය මගින් අභියාචක 2024.01.31 දින සිට දකුණු පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) තනතුරට පත්කර ඇත. අදාළ තනතුර ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරකි. ඒ අනුව රාජ්‍ය පරිපාලන ලේකම්ගේ නිර්දේශය මත අභියාචක 2024.01.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර පත්වීම් ලබා දී ඇත. ඒ බැව් 2024.08.02 දින දරන ලිපියෙන් අභියාචකට දන්වා ඇත. ඒ අනුව දැනටමත් අභියාචනය අදාල තනතුරට සහ සේවයට පත්වී ඇත. අභියාචකගේ ඉල්ලීම මගින් 2023.09.02 සිට 2024.12.31 දක්වා කාලය තුළ දකුණු පළාත් සභාවේ සේවයෙන් නිදහස් නොකළ කාලය සේවයට එක් කර දෙන ලෙසයි. එසේ වුවත් ඔහු එම පළාත් සභාවෙන් ඉවත් වීමට හෝ වෙනත් තනතුරක් භාර ගැනීමට උත්සාහ කළ බවක් දක්නට නැත. එසේම ඔහු පළාත් සභාවට අවශ්‍යම සේවකයෙක් නම් ඉන් පසුව ජනාධිපති ලේකම් කාර්යාලයට මුදාහැරියේ කෙසේද හා පුද්ගලික දුෂ්කරතා එක්වරම විසඳුනේ කෙසේද යන්න ප්‍රශ්නකාරී වේ.

එසේම දීපව්‍යාප්ත සේවාවල නිළධාරීන් අදාළ තනතුරට පත්කිරීමේදී පත්වීම භාර නොගැනීම නිසා ගැටලු රැසක් මතුවන බවද පෙනේ. AAT/27/2025 තීරණය මගින් ඒ බව දක්නට ඇත.

I. ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියේ සුදුසුකම් සපුරා ඇති නිළධාරීන් සිටියදී විශේෂ ශ්‍රේණියේ තනතුරක පුරප්පාඩුව පැවතීම සුදුසු නොවන බව.
II. ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියේ සුදුසුකම් සපුරාලන ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ ඊළඟට සිටින නිළධාරීන්ට සිදුවන අවස්ථාව අහිමි වීම.

III. පුරප්පාඩු තනතුරේ වෙනත් අඩු සුදුසුකම් සහිත පුද්ගලයකු වැඩ බැලීම/ රාජකාරී ඉටු කිරීමට පත් කිරීමට සිදු වීම.

IV. ඒ සඳහා වැඩ බැලීමට/ආවරණයට පත් කළ පුද්ගලයන්ට අමතර වැටුප්, දීමනා, වරප්‍රසාද දීමට සිදුවීම.

V. අභියාචක ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියේ පත්වීම් ලැබ පළමු ශ්‍රේණියේ පහළ තනතුරක තවදුරටත් රාජකාරී කිරීම. එසේ වුවත් ඉහළ තනතුරක වැටුප්, දීමනා,වරප්‍රසාද භුක්ති විඳීම.

VI. සියළු සුදුසුකම් සපුරා ඇතත් පුරප්පාඩු සීමිත වීම් මත ඊළඟට ජ්‍යෝෂ්ඨතා ලේඛනයේ සිටින පිරිස අපහසුතාවයට පත්වීම.

VII. පරිපාලනමය ලෙස පරිපාලන බළධාරීන් පත්වන අපහසුතා.

මේ සියළු කරුණු කෙරේ අවධානය යොමු කිරීමේදී අභියාචකගේ ඉල්ලීම සාධාරණ නොවන බව පෙනේ. ඒ අනුව අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමු. මේ තීරණය අභියාචක, ලේකම්/රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, ලේකම්/රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/